# පෙරපාසල් දරුවන්ගේ භාෂා හැකියා හඳුනාගැනීම සඳහා උපකරණ කට්ටලයක් සකසා සම්මත කිරීම

(කොළඹ හා මොණරාගල දිස්ත්‍රික්ක ඇසුරින්)

UNIVERSITY OF COLOMBO SRI LANKA
18 MAR 2004
LIBRARY

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව
සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධනය

STOCK VERIFICATION
14 OCT 2015

දෝන මාලිනී විජයලතා මූණසිංහ
ශාස්ත්‍රවේදී උපාධිය (දෙවන පහළ පෙළ)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
අධ්‍යාපනපති උපාධිය

UCLIB
516661
University of Colombo
Library
Sri Lanka

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය

2002

## සංක්ෂේපයෙන්

පෙරපාසල් දරුවන්ගේ භාෂා හැකියා හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි උපකරණ කට්ටලයක් සකසා සම්මත කිරීම් කර පද්ධතියට හඳුන්වා දීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කරන ලදි.

පූර්ව ළමා විය අධ්‍යාපනය හෙවත් පෙරපාසල් අධ්‍යාපනය සඳහා වර්තමානයේ දැඩි උනන්දුවකින් කටයුතු කරන ආකාරයක් දක්නට ඇත. එසේ වුව ද මෙම අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව මෙතෙක් කර ඇති පර්යේෂණ ඉතා සීමිත ය. පද්ධතිය තුළ දැනට පවතින අවශ්‍යතා යම් තරමකින් හෝ සපුරාලීමේ පරමාර්ථයෙන් මෙම පර්යේෂණය කිරීමට පෙළඹුණි. මෙම පර්යේෂණය සඳහා විශේෂයෙන් භාෂා ක්ෂේත්‍රය අළලා සැලසුම් කරන ලදි. මෙසේ භාෂා ක්ෂේත්‍රය තෝරාගැනීමට මූලික හේතුව වූයේ මුල් ළමා විය අවසානයේ දී දරුවා තුළ මවුබස පිළිබඳ හැකියාව අන් සියල්ලට ම වඩා සංවර්ධනය වී තිබීම අනාගත අධ්‍යාපනයට අඩිතාලමක් වන බැවිනි. මේ සඳහා පහත සඳහන් ක්‍රියාවලිය යොදා ගත් අතර, පෙරපාසල් අධ්‍යාපනයේ භාෂා ක්ෂේත්‍රයට අදාළ ව කරුණු රැසක් අනාවරණය කර ගැනීමට හැකි විය.

භාෂා විෂය ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් කොටස් 4ක් යටතේ අධ්‍යයනය කරනු ලබයි. එනම්, සවන්දීම, කථනය, කියවීම හා ලිවීම යනුවෙනි. මේ අතුරින් පෙරපාසල් දරුවන් තුළ වර්ධනය කළ යුතු භාෂා සංකල්ප හඳුනා ගැනීමෙහිලා ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන පූර්ව ළමා විය සංවර්ධනය සඳහා හඳුන්වා දෙන ලද වැඩ මාලාව ඇතුළත් ග්‍රන්ථ හා අනෙකුත් දේශීය ග්‍රන්ථ, පර්යේෂණ, විදේශීය ග්‍රන්ථ, සඟරා, අන්තර් ජාලය ඔස්සේ ලබා ගන්නා ලද තොරතුරු මගින් මෙන් ම පෙරපාසල් අධ්‍යාපන විශේෂඥයින්ගේ අදහස් ද ලබා ගන්නා ලදි. එසේ හඳුනා ගන්නා ලද සංකල්ප ඔස්සේ සැකසුනු අරමුණු හා අරමුණු අනුව ගොඩනැඟූ අභිමතාර්ථ මගින් ඉහත සඳහන් කළ භාෂා ක්ෂේත්‍ර 4 මුල් කරගත් උපපරීක්ෂණ 7ක් ගොඩ නඟන ලදි. එනම්, ශ්‍රවණ විභේදනය, දෘෂ්ටි විභේදනය, මනෝචාලක කුසලතා, සවන්දීම, කථනය, පෙරකියවීම හා පෙරලිවීම යන උපපරීක්ෂණ හතක් සඳහා උපකරණ කට්ටලයක් සකස් කර ගැනීමට හැකි විය.



University of Colombo Library * Sri Lanka *

සකස් කරන ලද පරීක්ෂණාංග පෙර පරීක්ෂණ පැවැත්වීමෙන් වඩාත් යෝග්‍ය වූ පරීක්ෂණාංග හඳුනා ගන්නා ලද අතර, එය අවසන් පරීක්ෂණයකට භාජන කරන ලදි. අවසන් පරීක්ෂණය සඳහා කොළඹ හා මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙහි රාජ්‍ය, ස්වේච්ඡා හා පෞද්ගලික අංශ නියෝජනයක් වන පරිදි අහඹු නියැදි ක්‍රමයට පෙරපාසල් 30ක් (එක් දිස්ත්‍රික්කයට 15 බැගින්) තෝරා ගන්නා ලදි. එම පෙරපාසල් 30හි ගැහැණු හා පිරිමි දරුවන් සමානුපාතික ව නියෝජනයක් වන පරිදි 480 ක නියැදියක් මගින් තොරතුරු රැස් කරන ලදි.

පරීක්ෂණය සම්මත කිරීම සඳහා සංඛ්‍යාන විද්‍යාත්මක ව දුෂ්කරතා, විභවනතා දර්ශක ගණනය කර යෝග්‍ය පරීක්ෂණාංග තෝරා ගැනීම කළ යුතු වුව ද මෙම පර්යේෂණයේ දී වඩාත් යෝග්‍ය වූ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමය ලෙස දරුවන්ගෙන් ලත් ප්‍රතිචාර මත ප්‍රතිශතක අගයන් ගණනය කරන ලදි. එසේ ගණනය කිරීමෙන් වැරදි හා කිසිදු ප්‍රතිචාරයක් නො දුන් ප්‍රමාණයෙන් ප්‍රතිශත අගය මත නිවැරදි පිළිතුර මෙන් ම පිළිතුරු නිවැරදි නමුත්, සම්පූර්ණයෙන් පිළිතුර නො දුන් දරුවන් ලැබූ ප්‍රතිශත අගය හා සැසඳීමෙන් වැරදි හා ප්‍රතිචාර නො දුන් පරීක්ෂණාංග ඉවත් කරන ලදි. සුදුසු වූ පරීක්ෂණාංග තව දුරටත් වඩාත් යෝග්‍ය පරිද්දෙන් සංස්කරණය කරන ලදි. ඒ සඳහා පෙරපාසල් අධ්‍යාපනඥයින්ගෙන් මෙන් ම භාෂාව පිළිබඳ වඩා නිපුණත්වයක් සහිත සම්පත් පුද්ගලයන්ගේ අදහස් ලබා ගැනීමට හැකි විය. ඒ අනුව වඩාත් යෝග්‍ය වූ පරීක්ෂණාංග තෝරා ගැනීම සිදු කරන ලද අතර, මූලික පරීක්ෂණ 84 කින් 50 ක් තෝ ගැනීමට හැකි විය.

මෙම පර්යේෂණය තුළින් පහත සඳහන් කරුණු අනාවරණය කර ගැනීමට හැකියාව ලැබුණි.

1. පෙරපාසල් දරුවන් සඳහා භාෂා විෂය ක්ෂේත්‍රය යටතේ ශ්‍රවණ විභේදනය, දෘෂ්ටි විභේදනය, මනෝචාලක කුසලතා, සවන්දීම, කථනය, පෙරකියවීම හා පෙරලිවීම යන ක්ෂේත්‍ර හත වැදගත් වන බවත් මෙම ක්ෂේත්‍ර වර්ධනයට අදාළ පූර්ව කුසලතා ලබා දීමේ අවශ්‍යතාව මතු වීම.
2. විධිමත් පාසලට ඇතුළත් වීමට පෙරපාසල් දරුවන් ළඟා විය යුතු මට්ටම කුමක් ද යන්න ඉහත පරීක්ෂණ හත ඔස්සේ හඳුනා ගැනීමට හැකියාවක් ලැබීම.
3. උපපරීක්ෂණ හත සඳහා දරුවන්ගෙන් ලත් ප්‍රතිචාර ඉහළ මට්ටමක පවතින බවත් හා උපපරීක්ෂණ අතර සුළු වෙනස්කම් කිහිපයක් පමණක් දක්නට ලැබීම.

4. උපපරීක්ෂණ හත සඳහා සකස් කරන ලද පරීක්ෂණාංග සම ප්‍රමාණයක් අඩංගු නො වේ. එසේ වුව ද, දරුවන් තුළ ගොඩ නැගිය යුතු භාෂා සංකල්ප සියල්ල ආවරණය වන පරිදි පරීක්ෂණාංග ගොඩ නැඟීම.

5. පෙරපාසල් දරුවන් 480 දෙනා විසින් පරීක්ෂණාංග 50 ක් සඳහා මුහුණදුන් ආකාරය අනුව වඩා හොඳ ප්‍රතිචාර කථන ක්ෂේත්‍රය සඳහා ලැබී ඇති නමුත් සවන්දීම ක්ෂේත්‍රය සඳහා අඩු ප්‍රතිචාරයක් ද ලැබී ඇත. ඒ අනුව ශ්‍රවණ විභේදනය සඳහා ද එවැනි අඩු ලක්ෂණයක් හඳුනාගත හැකි වීම.

6. ඉදිරිපත් කර ඇති පරීක්ෂණාංග සියල්ල සඳහා ලකුණු 0 ලබාගත් කිසිදු දරුවකු නොමැති බව දක්නට ලැබීම.

7. මෙම පර්යේෂණය පරීක්ෂණයක් ලෙස හඳුන්වා දීමට නොව, පෙරපාසල් ගුරුවරු සඳහා මඟ පෙන්වන්නක් මෙන් ම මෙමගින් හඳුන්වා දෙන තක්සේරු ක්‍රියාවලිය මගින් දී ඇති නිර්ණායක ඔස්සේ දරුවා පිළිබඳ තීරණ ගැනීමේ ලා හැකියාව ලැබීම. එමගින් දරුවා තුළ පවතින දුබලතා මෙන් ම ප්‍රබලතා හඳුනා ගැනීමටත්, දුබලතා සහිත දරුවන්ට ප්‍රතිකාර කිරීමටත් දක්ෂතා පෙන්නුම් කරන දරුවන් සඳහා තවදුරටත් උදව් කිරීමටත් හැකියාවක් ලැබීම. එමෙන් ම මෙය පරීක්ෂණ තත්ත්වයෙන් මිදී කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් බව හඳුනා ගත හැකි වීම.

8. දරුවන්ගේ විධිමත් පාසල් ප්‍රවේශයට පෙර භාෂා ක්ෂේත්‍රයේ සෑම අංශයක් ම නියෝජනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගතයුතු අතර එය වෙන් වූ ක්‍රියාවලියක් නොව සමෝධානිත ව කළ යුතු කාර්යයක් ලෙසත්, එමගින් වාග් මාලා පෝෂණය හා අනෙක් විෂයයන් සඳහාත් මෙය බෙහෙවින් බලපාන බවත් කිව හැකි වීම.